**අක්කරෙයිපත්තු මහා නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 17 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ කොමසාරිස්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ දී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද මහ නගර සභාවේ නමට අයිතිය මාරු කරන ලද වාහන 10 ක වටිනාකම වන රු.85,487,000 ක් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී තනි පුද්ගලයින් විසින් පරිත්‍යාග වශයෙන් දෙනු ලැබූ පුස්තකාල පොත් 347 ක වටිනාකම වන රු.125,158 ක් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 137,654,533 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ලී බඩු හා සවිකිරීම් | 3,798,262 | |
| මෝටර් වාහන සහ කරත්ත | 6,440,748 | |

### 1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 252 වන පරිච්ඡේදයේ 218 වගන්තිය | පාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සකස් කළ යුතු විස්තරාත්මක වාර්තාව 2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 සිට වර්ෂ 05ක් දක්වා කාලයක් කල් ඉකුත් වූ රු.2,473,260 ක් වටිනා ආපසු ගෙවිය යුතු තැන්පතු 120 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | (i) 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | එක් එක් පළාත් පාලන ආයතනය විසින් නගර සංවර්ධනය නමින් වූ බැංකු ගිණුමක් ආරම්භ කර එම ගිණුමට සේවා ගාස්තු සහ දඩ ගාස්තු තැන්පත් කළ යුතු බවට දැනුවත් කර තිබුණත් මහනගර සභාව විසින් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 1989 අප්‍රේල් 29 දිනැති අංක 02/1/10 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මහ නගර සභාවේ අනුමැතිය ලබාගැනීමේදී ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය අධිකාරියේ නිර්දේශය ලබා ගත යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් 61 ක් සඳහා එලෙස නිර්දේශ ලබාගැනීමකින් තොරව අනුමත කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.21,874,474 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,293,330 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 581,144 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 දේපල බදු

මහා නගර සභා ආඥා පනතේ 252 (1)(ආ) වගන්තිය අනුව සහා බල ප්‍රදේශයේ පදිංචි වී සිටින දේපළ හිමියන් 12,873 දෙනෙකුගෙන් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගත යුතු මුළු එකතුව රු. 27,003,459 ක් වූ වරිපනම් බදුවලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සියයට 23 ක් වන රු.6,316,538 ක් පමණක් අයකර ගෙන තිබුණි.

**2.2.2 මස් කඩ, පොදු වෙළඳපොල කඩ කාමර සහ වාහන නැවතුම්පොළ බදු දීම**

---

2016 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී රු. 6,481,274 කින් රු.5,428,981 ක හිඟ කඩ කුලී, වර්ෂ 02 කට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව පැවතුණි.

**2.2.3 පොදු වෙළඳපොල කඩ කාමර කුලියට දීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපොල හිඟ කඩ කුලී රු.7,039,307 කින් රු.5,239,637 ක් වර්ෂ දෙකකට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) පොදු වෙළඳපොල කඩ කාමර 236 ක් බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුම් ප්‍රකාරව, ගිවිසුම් කාලය 2015 ජුලි 05 දින අවසන් වන නමුත්, බදුකරුවන් විසින් කඩ කාමර ආපසු භාර දී නොතිබුණි. එසේ වුවද, ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාර අමතර ගාස්තු අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පොදු වෙළඳපොල කඩ කාමර 94 ක් 2014 වර්ෂයේ සිට බදු දී නොමැතිව වසා දමා තිබුණි. මෙම කඩ කාමර බදු දීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කළමනාකරණ දුර්වලතා**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ වාහන 08 ක් සහ ට්‍රැක්ටර් 08ක් මේ දක්වා අයිතිය මාරුකර ගෙන නොතිබුණි.

(ආ) මහා නගර සභාවට අයත් වාහන 03 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 06 ක් සහ ට්‍රැක්ටර් 03 කට නිශ්චිත කාල සීමාව තුළ වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීමට නොහැකි වීම හේතුකොට ගෙන එම කාල පරාසයකට අදාළ දඩ ගාස්තු ලෙස රු.23,460 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) 2012 සහ 2013 වර්ෂවලදී සේවය අත්හිට වූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.64,598 ක හිඟහිටි ණය ශේෂය ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ග 60 කට අයත් භාණ්ඩ 377 ක් වෙන්දේසි මඟින් විකිණීම සඳහාත්, වර්ග 15 කට අයත් භාණ්ඩ 89 ක් විනාශ කිරීම සඳහාත් සහ වර්ග 24 කට අයත් භාණ්ඩ 89 ක් අලුත්වැඩියා කිරීමටත් නිර්දේශ කර තිබූ නමුත්, මේ දක්වා එම කටයුතු සිදු කිරීමට මහා නගර සභාව පියවර ගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ 06 කට ප්‍රථම සභාවේ සේවකයෙකු හා ප්‍රජා පාදක මධ්‍යස්ථානයකට ලබා දී තිබූ රු.106,003 ක් වටිනා අත්තිකාරම් 2 ක් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**3.2** **උපයෝජනය නොකළ වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පැවති ට්‍රැක්ටර් 06 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක්, ඩබල් කැබ් රථ 01 ක් සහ එක්ස්කැවේටර් 01 ක් අලුත්වැඩියා කිරීමට පියවර නොගෙන වර්ෂ 03 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2014 සහ 2015 කාලපරිච්ඡේදය තුළ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මහා නගර සභාවේ පුස්තකාල වෙනුවෙන් ලබාදෙනු ලැබූ රු.මිලියන 13.69 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් අදාළ අරමුණු සඳහා යොදා නොගෙන පුස්තකාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි.

**4.** **යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**4.1** **නිරවුල් නොකළ විගණන ඡේද**

2012 වර්ෂයේදී මහා නගර සභාවේ අතුරුදහන් වූ රු.535,500 ක් වටිනා පරිගණක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් කළමනාකරණය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර කොන්ත්‍රාත්තු ලබාදීම. |